Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019-12-12

පැමිණිලි පාර්ශවය : 01. එන්.එච් මොහොමඩ් මයා,
නො 126, බෞද්ධාලෝක පාර,
කුරුණෑගල.

02. එච්.එම්.ජී.කේ හේරත් මයා,
නො : 18/1, 1/1, 4 වන පටුමග,
ඉලුප්පුගෙදර පාර, කුරුණෑගල.

03. එච්.ජේ.එම්.එන් නුවන්දි මිය,
නො 126, බෞද්ධාලෝක පාර,
කුරුණෑගල.

04. ටී.එම්.එස් තෙන්නකෝන් මයා,
නො 126, බෞද්ධාලෝක පාර,
කුරුණෑගල.

05. එස්.ඩබ්.සී ශ්‍රියාලතා මිය,
නො : 115/12/01, මීගමු පාර,
කුරුණෑගල.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පති,
මලියදේව විද්‍යාලය,
කුරුණෑගල.

02. සභාපති,
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
මලියදේව විද්‍යාලය,
කුරුණෑගල.

03. සභාපති,
අභියාචනා මණ්ඩලය,
මලියදේව විද්‍යාලය,
කුරුණෑගල.

<u>පැමිණිලි අංකය : HRC/K/128/19</u>

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-

ඉහත පැමිණිලි පාර්ශවයන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2019 වර්ෂයේ කුරුණෑගල මලියදේව විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට තම දරුවන් ස්ථාන මාරු ගණය යටතේ ඇතුළත් කිරීමේ අපේක්ෂාවෙන් අයදුම්පත් යොමුකර සම්මුඛ පරික්ෂණයට හා අභියාචනා පරීක්ෂණයට ඉදිරිපත් වී අවශ්‍ය ලකුණු ලබාගෙන තිබුනද තමන්ගේ දරුවන් අවසන් තේරීම් ලේඛනයට ඇතුළත් කර නොතිබූ බවයි.

ඒ අනුව, පැමිණිල්ලෙන් දක්වා ඇති පරිදි එක් එක් දරුවා විසින් ලබා ගත් ලකුණු පහත පරිදි වේ.

| | අයදුම්කරු | ලබාගත් ලකුණු |
|---|---|---|
| 01 | එන්.එච්. මොහොමඩ් මයා, | 90 |
| 02 | එච්.එම්.ජී.කේ හේරත් මයා | 84 |
| 03 | එච්.ජේ.එම්.එන් නුවන්දි මිය | 92 |
| 04 | ටී.එම්.එස් තෙන්නකෝන් මයා | 90 |
| 05 | එස්.ඩබ්.සී ශ්‍රියාලතා මිය | 88 |

පැමිණිලිකරුවන් දක්වා ඇත්තේ, තම දරුවන් අවසන් ලේඛනයට ඇතුළත් නොකිරීම පිළිබඳ තොරතුරු සොයා බැලීමේදී, අදාළ ගණය යටතේ අයදුම් කිරීමේදී අයදුම්කරු හා දරුවා වර්ථමාන පදිංචි ස්ථානයට පැමිණීමට පෙර, පෙර සේවා ස්ථානයේ දරුවාද සමඟ පදිංචි වී සිට පැමිණි බවට තහවුරු කළ හැකි සහතිකයක් ඉදිරිපත් කර නොමැති බැවින් තම දරුවන් තෝරා ගෙන නොමැති බවට දැනගැනීමට ලැබුනු බවයි.

පැමිණිලි පාර්ශවය වැඩිදුරටත් පෙන්වා දී ඇත්තේ, කුරුණෑගල මලියදේව විද්‍යාලයේ සම්මුඛ පරික්ෂණ මණ්ඩලය විසින් පවත්වන ලද සම්මුඛ පරික්ෂණ දෙකෙහිදීම අදාළ සහතිකය පිළිබඳව විමසීමක් සිදු නොකළ බවත්, ඔවුන්ගේ උපදෙස් පත්‍රිකාවේද කිසිදු ස්ථානයක එබඳු ලේඛනයක් පාසලට ලබාදෙන ගොනුවට එකතු කරන ලෙස ඉල්ලා නොමැති බවත්ය.

පැමිණිලි පාර්ශවය කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත්තේ, සම්මුඛ පරික්ෂණ මණ්ඩලයේ වැරදි ක්‍රියාමාර්ග හේතුවෙන් තමන්ගේ දරුවන් තෝරා ගැනීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බැවින් තමන්ගේ දරුවන් කුරුණෑගල මලියදේව විද්‍යාලයට ඇතුළත් කරගැනීමට අවස්ථාව ලබා දෙන ලෙසයි.

වගඋත්තර පාර්ශවීය සැළකිරීම :-

අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවීය මලියදේව විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලි වල එක් පැමිණිලිකරුවකු වන එන්.එච් මොහොමඩ් යන අය රාජ්‍ය සේවයේ ස්ථාන මාරු පදනම යටතේ යොමු කර ඇති අයදුම්පතට

අනුව සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලකුණු 90 ක් ලබාගගෙන අතර, එම අයදුම්පත අනන්‍යාගමික ගණයෙහි ලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සුදුසුකම් පරීක්ෂා කරන ලද බවත්, ඒ අනුව මලියදේව විද්‍යාලයට බඳවා ගත් සමස්ත සිසුන් ගණන 192 ක් වන අතර, චක්‍රලේඛ ප්‍රකාරව අන්‍යාගමික සිසුන් 02 කු බඳවා ගැනීමට හැකියාව තිබූ බවත්ය.

රජයේ ස්ථාන මාරු ගණය යටතේ ලකුණු 90 ක් ලබාගත් ඉහත අයදුම්කරුවකු එම ගණයේ අවම ලකුණු සීමාවට ඉහළින් ලකුණු ලබාගෙන තිබූ නමුත්, එම අයදුම්පත සලකා ඇත්තේ අන්‍යාගමික පදනමින් වන බවත්, ඒ අනුව ආසන්න ගණයෙන් වැඩිම ලකුණු ලබාගත් අන්‍යාගමික අයදුම්කරුවන් තෝරාගෙන අනෙකුත් අයදුම්කරුවන් තෝරා ගැනීමේදී 24/2018 චක්‍රලේඛනයේ 9.3.2 වගන්ති ප්‍රකාරව ලකුණු ලබාදීමට කටයුතු කිරීමට අභියාචනා මණ්ඩලය තීරණය කරන ලද බවත් සඳහන් කර ඇත.

24/2018 දරණ චක්‍රලේඛනයේ 9.3.2 වගන්ති පදනම් කරගනිමින් අයදුම්කරුවන්ගේ පදිංචියේ ආසන්නතාවය නිර්ණායකයක් ලෙස සලකා ආසන්න පදිංචිය මත අයදුම්කළ අයදුම්කරුවන් තිදෙනෙකු අවසාන ලේඛනයෙන් තොරාගත් දෙදෙනකු සහ පොරොත්තු ලේඛනයේ අන්‍යාගමික අයදුම්කරුවකු ලෙස නම් ඇතුළත් කළ බවත්,

තවද, 24/2018 චක්‍රලේඛනයේ 9.6 උප වගන්තිය ප්‍රකාරව "එමෙන්ම පෙර සේවා ස්ථානයේ පිහිටා ඇති ප්‍රදේශයේ ළමයාද සමඟ පදිංචිව සිට නව සේවා ස්ථානයට ළමයාද සමඟ පැමිණිය යුතුය" යන කරුණට අදාළ අවශ්‍යතාද මෙම අයදුම්කරුවන් සපුරා නොතිබූ බවත්, චක්‍රලේඛනයට අනුව ස්ථාන මාරු ගණයට අදාළ කරුණු තහවුරු කර නොමැති බවත්, 2019 වසර සඳහා පළමු ශ්‍රේණියට ළමුන් බඳවා ගැනීමේදී චක්‍රලේඛයට අනුකූලව තමා විසින් කටයුතු කර ඇති බවත් දන්වා ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලි පාර්ශවයේ දරුවන් කුරුණෑගල මලියදේව විද්‍යාලයේ 1 වන වසරට 2019 වර්ෂයේදී ස්ථාන මාරු ගණය යටතේ ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසු පවත්වන ලද සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් වී ලබාගෙන ඇති ලකුණු අනුව පොරොත්තු ලේඛනවලට ඇතුළත් වී ඇති බව තහවුරු වේ.

ස්ථාන මාරු යටතේ ඇතුළත් කළ අවසන් ලේඛනයේ (2018.12.17 දින) සුදුස්සන් 05 දෙනකු නුසුදුස්සන් වී ඇති බවත්, නමුත් 2018.01.14 ප්‍රසිද්ධ කළ අවසන් ලේඛනයට ස්ථාන මාරු පදනම යටතේ වන අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් කර නොතිබූ බවත් නිරීක්ෂණය වේ.

පසුව ස්ථාන මාරු ගණය යටතේ අවසන් තේරීම් ලේඛනය ප්‍රසිද්ධ කිරීමේදී (2019.03.06) පැමිණිලිකරුවන්ගේ දරුවන්ගේ නම් ඇතුළත් කර නොමැති අතර පුරප්පාඩු 08 ක් සඳහා ස්ථාන මාරු ගණය යටතේ තිදෙනකු හා වෙනත් ගණවලින් 05 දෙනකු තොරාගෙන පුරප්පාඩු 8 සඳහා අවසන් තේරීම් ලේඛනය ප්‍රසිද්ධ කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුවන්ගේ දරුවන් ස්ථාන මාරු ගණය යටතේ තෝරා නොගැනීමට හේතුව ලෙස වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, සම්මුඛ පරීක්ෂණයේදී වර්ථමාන සේවා ස්ථානයට පැමිණීමට පෙර, පෙර සේවා ස්ථානය පිහිටා ඇති ප්‍රදේශයේ දරුවාද සමග පදිංචි වී සිටි බවට පෙර පදිංචිය හා කාලය පිළිබඳව එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ සහතිකය ඉදිරිපත් කළ යුතු නමුත් පැමිණිලි පාර්ශවය අදාළ සහතිකය ඉදිරිපත් නොකිරීම බවයි.

නමුත් අදාළ සහතිකය නොමැතිව පැමිණිලි පාර්ශවය වෙත ලකුණු ලබා දී තාවකාලික පොරොත්තු ලේඛනයේ ඔවුන්ගේ නම් ඇතුළත් කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කටයුතු කිරීම මඟින් ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු හා ලේඛන ප්‍රමාණවත් බව පෙනී යයි.

තවද පැමිණිලිකරුවන් තම සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර කුරුණෑගල මලියදේව විද්‍යාලය මඟින් යවා ඇති උපදෙස් ලිපියෙහි පෙර සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ දරුවාද සමඟ පදිංචිව සිට පැමිණි බවට ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතු බව සඳහන් නොවන අතර, පැමිණිලිකරුවන් හට වෙනත් පාසල්වලින් එවන ලද උපදෙස් ලිපිවල අදාළ සහතිකය රැගෙන එන ලෙස සඳහන් වී ඇති බව නිරීක්ෂණය වේ.

තවද පෙර සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ දරුවාද සමඟ පදිංචිව සිටි බවට ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළයුතු බව වගඋත්තර පාර්ශවය සඳහන් කළද තෝරාගෙන ඇති තිදෙනාගෙන් ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කර ඇත්තේ එක් අයකු පමණක් බව නිරීක්ෂණය වේ.

තවද ස්ථාන මාරු ගණය යටතේ තෝරාගත් ලේඛනය අමාත්‍යාංශ උපදෙස් ලැබුණු පසු ප්‍රසිද්ධ කරනු ලබන බව දැන්වීම් පුවරුවේ සටහන් කර තිබුනද ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කිසිදු උපදෙසක් ලිඛිතව ලබානොගෙන වෙනත් ගණයකින් පස් දෙනකු ඇතුළුව 08 දෙනකු තෝරාගෙන ඇත්තේ විද්‍යාලයේ අභිමතය මත බව නිරීක්ෂණය වේ.

ස්ථාන මාරු ගණය යටතේ පැමිණිලිකරුවන් ඇතුළු අයදුම්කරුවන් 46 දෙනකු සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී ඇති නමුත් එයින් 43 දෙනකුගේ දරුවන් තෝරාගැනීමට කටයුතු කර නොමැත්තේ, පෙර පදිංචි ස්ථානයේ දරුවාද සමඟ පදිංචි වී සිටි බවට තහවුරු කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකය නොමැති වීම මත බව නිරීක්ෂණය වන අතර, ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය වගකිවයුතු බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

මෙකී සමස්ත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී, 2019 වර්ෂයේ 1 වන වසර සඳහා කුරුණෑගල මලියදේව විද්‍යාලයට දරුවන් ඇතුළත් කරගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා විරෝධතා හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය නිසි පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් පැමිණිලිකරුවන්ගේ දරුවන් කරුණෑගල මලියදේව විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවත්, එමඟින්

වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලි පාර්ශවයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුවන්ගේ දරුවන් වගඋත්තරකාර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත දන්වා සිටිමි.

2019.12.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/